# 2 සත් හට වන බව දුකට වෙදාණන්



**2.1 රූපය**

තථාගතයන් වහන්සේ ලෝවැස්සන්ගේ දුක්වලට පිළියම් කරන මහවෙදාණන් හැටියට දක්වන පිළිමයක් (ජපන්රට)

එදා ඉරිදා දවසක්. මම හිමිදිරියේ ම අවදි වී සූදානම් වූයේ දහම් පාසලට යාමටයි. මිදුලේ වතුසුද්ද ගසේ සුදෝ සුදු පාටින් පිපී තිබුණු මල්වලින් මල් වට්ටිය සරසා ගත් මම දහම් පාසලට ගියෙමි. උදෑසන රැස්වීම අවසන් වී පන්තියට ගිය පසු අපේ "කපීකෝද්‍රය" සමිතියේ සභාපතිතුමා දැනුම් දුන්නේ එදින සමිතියේ දී බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය හා ගිලනුන්ට පිහිට වීම පිළිබඳ ව කථා පැවැත්වෙන බවයි. පළමු කාලච්ඡේද හතර ගත වීමෙන් පසු කපීකෝද්‍රය සමිතිය ආරම්භ විය.

සමිතියේ මූලික වැඩ කොටස නිමා වීමෙන් පසු ව එදින විශේෂ වැඩ සටහන ඇරඹිණි.

**සභාපතිතුමා,**

| | |
|---|---|
| බුදුවෙමි අනුන්හට කරවමි | අවබෝද |
| මිදෙනෙමි සතුන් මුදවමි නොව | පරමාද |
| බව බැමි බිඳිමි බිඳුවමි යන | සිතුපෑද |
| මගෙ හිමි සඳිනි වෙන කිසිවෙක් | සිතුවේද |

අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයක් පාරමිතා පුරා සම්මා සම්බෝධියට පත්වූයේ එදා අප වැනි සසර අසරණ වූ සත්ත්වයන්ට සරණ වීමට බව එම කවිය ම අපට නිදසුන් දක්වනවා. ඒ නිසා ම අද අපේ "කපීකෝද්‍රය" සමිතියේ දී බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණයත්, ගිලනුන්ට පිහිට වීමේ ගුණයත් පිළිබඳ ව කථා කිරීමට තීරණය කළා. ඒ අනුව උන්වහන්සේගෙන් පිහිට ලබා සැනසුම් සුවයට පත් අපමණ සත්ත්වයින්ගෙන් කිහිපදෙනකු පිළිබඳ ව අද අපි කථා කරමු. ප්‍රථමයෙන් ම බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ ආකාරය පැහැදිලි කරමින් කතා කරන්නේ දහවන ශ්‍රේණියේ මානෙල් කුමාරි සොහොයුරියයි.



2.1 රූපය

## බුදුරදුන් ගිලනුන්ට උපස්ථාන කළ අයුරු

ගරුතර ස්වාමීන් වහන්සේ සහ ගුරු මණ්ඩලය ඇතුළු සියලු දෙනාගෙන් ම අවසරයි. අද මගේ මාතෘකාව අප තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අයුරු යන්නයි. මෙහි දී මගේ සිහියට නැගෙන්නේ "පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ" ගේ කතාවයි.

බුදුරජාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වසන කාලයේ **තිස්ස** නමින් භික්ෂූන් වහන්සේ නමක් සිටියා. ටික කලක් ගත වන විට මේ හාමුදුරුවන්ගේ ශරීරය පුරා පුංචි බිබිලි රාශියක් හටගත්තා. තවත් ටික කාලයක් ගත වන විට ඒ බිබිලි ගෙඩි බවට පත්වෙලා පැසවලා, ඒවා පිපිරිලා සැරව ගලන්න පටන් ගත්තා. සෙසු භික්ෂූන් වහන්සේලා කොතරම් බෙහෙත් කළත් උපස්ථාන කළත් ඒවා සුව වුණේ නැහැ. තිස්ස තෙරුන්ගේ ශරීරයෙන් සැරව ගලන නිසා පූතිගත්ත යන නාමය තිස්ස යන නමට එකතු වී පසු ව පූතිගත්ත තිස්ස කියා ප්‍රසිද්ධියට පත් වුණා.

අන්තිමේ දී මේ හාමුදුරුවන්ට මොකද වුණේ කියලා ඔයාලා දන්නවා ද? අනේ! උපස්ථාන කරන්න හිටිය භික්ෂූන් වහන්සේලාත් උන් වහන්සේව පිළිකුල් කර මඟහැර ගියා.

දවසක් බුදුහාමුදුරුවෝ මහා කරුණාවෙන් ලෝකය දෙස බලන විට දැක්කා ඉතාමත් ම අසාධ්‍ය තත්ත්වයෙන් කිසිවකුගේ පිහිටක් නැතුව දුක් විඳින පූතිගත්ත තිස්ස තෙරුන්.

උන්වහන්සේ මොකක් ද දන්නවා ද කළේ, පූතිගත්ත තිස්ස තෙරුන්ගේ කුටියට වැඩම කරලා මුලින් ම කළේ වතුර මුට්ටියක් උණු කිරීම. ඊට පස්සේ අනෙක් භික්ෂූන් වහන්සේලාගේ ද සහයෝගයෙන් ඇඳ පිටින් ම ඔසවාගෙන අවුත් අර සැරව හා ලේ තැවරුණු පූතිගත්ත තිස්ස තෙරුන්ගේ සිවුර අපේ බුදුහාමුදුරුවෝ උණු වතුරෙන් සෝදලා වේලෙන්න දාලා තෙරුන්වහන්සේ ද උණු වතුරෙන් නාවලා පිරිසිදු කළා. පස්සේ වේළුණු සිවුර පොරවලා කායික ව සහනයක් ලබා දීලා මානසික සුවය ලබා දීමට ධර්ම දේශනා කළා. අපේ බුදුහාමුදුරුවන්ගේ ධර්ම දේශනාව අවසන් වන විට ම පූතිගත්ත තිස්ස තෙරුන් වහන්සේ රහත් වෙලා පසු ව පිරිනිවන් පෑවා. ගිලන් වී කාගෙවත් පිහිටක් නැති ව සිටි පූතිගත්ත තිස්ස තෙරුන්ව බුදුරදුන් සුවපත් කළ ආකාරයයි ඒ.

ඒ වගේ ම එක් දිනක් බුදුරජාණන් වහන්සේ රජගහ නුවර **පිප්ඵලී ගුහාව** නම් වූ ස්ථානයට වැඩම වූයේ **මහා කාශ්‍යප** මහ රහතන් වහන්සේ දැඩි සේ ගිලන් ව සිටිය දී සුවදුක් බලා සුවපත් කිරීමටයි. රෝගියකු සමඟ ඉතා සුහද ව කථා කළ යුතු ආකාරය ද ප්‍රකට වන මෙහි දී බුදුරජාණන් වහන්සේ සත්‍ය ක්‍රියා කර පිරිත් දේශනා කරමින් කාශ්‍යප මහරහතන් වහන්සේව සුවපත් කළා. **මුගලන්** මහරහතන් වහන්සේ ද මෙලෙසින් අසාධ්‍ය ලෙස රෝගී වූ අවස්ථාවක බුදුරජාණන් වහන්සේ රජගහ නුවර **කලන්දක නිවාප** නම් වූ තැනට වැඩමවා සත්‍ය ක්‍රියා කොට පිරිත් දේශනා කොට සුවපත් කළා. ඒ පිරිත් සූත්‍ර දෙක තමයි,

**මහාකස්සපත්ථෙර බොජ්ඣංග සූත්‍රය හා මහාමොග්ගල්ලානත්ථෙර බොජ්ඣංග සූත්‍රය.**



2.3 රූපය

බුදුරජාණන් වහන්සේ තිලෝගුරු වුවත් ඉතාමත් නිහතමානී ව ගිලනුන්ට ඒ අයුරින් උපස්ථාන කළේ නම් අප ද ගිලන් වූ අයට, රෝගී වූ අයට පිහිට විය යුතුයි නේ ද? මඳක් හිතන්න ආරෝග්‍ය ශාලාවල වැඩිහිටි නිවාසවල එවැනි ගිලන් වූවන් කොපමණ සිටිනවා ද? ගිලන් වූ අයට අපට පුළුවන් සැම විට ම පිහිට විය යුතුයි. අපේ බුදුහාමුදුරුවෝ දේශනා කරලා තියෙන්නේ "යම් කෙනෙක්

ගිලනුන්ට උපස්ථාන කරයි ද හෙතෙම මට උපස්ථාන කරයි" කියලයි. ඒ අනුව ගිලනුන්ට උපස්ථාන කිරීම ද ප්‍රතිපත්ති පූජාවෙන් බුදුහාමුදුරුවන් පිදීමක් බව පැහැදිලි වෙනවා. ඒ නිසා අපි සැම විට ම ගිලනුන්ට උපස්ථාන කරමු. ඔබ සැමට තෙරුවන් සරණයි.

**සභාපති**

මානෙල් කුමාරි සොහොයුරියට අපේ ස්තුතිය පුද කරමින් දැන් මගේ ආරාධනය බුදුරදුන්ගේ අසරණ සරණ ගුණය පැහැදිලි කරමින් කථාවක් පැවැත්වීමට අප දහම් පාසලේ නවය ශ්‍රේණියේ සඳුන් සොහොයුරාටයි.

## බුදුරදුන් අසරණයන්ට පිහිට වූ අයුරු

ගරුතර ප්‍රධානාචාර්ය ස්වාමීන් වහන්සේගෙන් අවසරයි. මූලාසනය ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි.

සෙත් සිරි දෙන මහ ගුණ මුහුදාණන්
සත්හට වන බව දුකට වෙදාණන්
තිත් ගණඳුර දුරලන දිනිදාණන්
සිත් සතොසින් නමදිම් මුනිඳාණන්

යනුවෙන් ලෝවැඩ සඟරා කතුවරයා සඳහන් කරන්නේ සංසාරයේ දුක් විඳිමින් අසරණ භාවයට පත් වූවන් සඳහා වෛද්‍යවරයකු වශයෙන් පිළිසරණ වූයේ අප සම්මා සම්බුදුරජාණන් වහන්සේ බවයි. උන්වහන්සේගේ එක ම අපේක්ෂාව වුණේ සත්ත්වයා භව දුකින් එතෙර කරවීමයි. ඒ නිසයි සැම දිනක ම මහා කරුණාවෙන් ලොව බලා එක් අයකුට හෝ පිහිට වීම පුරුද්දක් කරගෙන තිබුණේ. උන්වහන්සේ අසරණයින්ට පිහිට වූ අවස්ථා රාශියක් බුද්ධ චරිතය තුළින් ම පැහැදිලි වෙනවා. ඒ අතර පිහිට ලැබූ කෙනෙක් **සුනීත.**

### සුනීතට පිහිට වීම

දවසක් අපේ බුදුහාමුදුරුවෝ සැවැත් නුවර ජේතවනාරාමයේ සිට රජගහ නුවර වේළුවනාරාමයට වඩිමින් සිටින අවස්ථාවේ මඟ දී සුනීත නම් කසළ සෝධකයකු මුණ ගැසුණා. ඈත දී ම බුදුරදුන්ව දුටු සුනීත තම කරෙහි වූ කසළ කද බිම තබා මාර්ගයෙන් පසෙකට වී සිටියා. ඔහු ළඟට වැඩි බුදුරජාණන් වහන්සේ සුහදශීලී ව කථාබහ කොට පැවිදි වීමට කැමති ද යි විමසුවා.

"අනේ අපි වගේ කුණු කසළ අදින්නන් පැවිදි කර ගැනීමට කැමති වෙන්නේ කවු ද?" යනුවෙන් සුනීත විමසුවා. 'එන්න මා සමග, මම ඔබ පැවිදි කරන්නම්' කියා පැවසූ බුදුරදුන් ඔහු රැගෙන ගොස් පැවිදි කළා. පැවිදි වූ සුනීත හාමුදුරුවෝ වැඩි කලක් ගතවීමට පෙර රහත් වුණා. ඒ නිසා කසළ අදිමින් ජීවිතයේ අපමණ දුක් වින්ද අසරණ සුනීතට සියලු සමාජයෙන් වැඳුම් පිදුම් ලබාගෙන සංසාර දුකෙන් නිදහස් වීමටත් පුළුවන් වුණා.



**2.1 රූපය**

## සෝපාකට පිහිටවීම

ඒ වගේ ම බුදුරජාණන් වහන්සේගේ පිහිට ලබා ජීවිතයේ සැනසුම ලැබූ තවත් කෙනෙක් සෝපාක. තම පියා මිය යාමෙන් පසු ව කුඩා සෝපාක හැදුණේ වැඩුණේ තම සුළුපියා සමගයි. එහෙත් ඔහු සෝපාකට හිංසා පීඩා කළා. දිනක් කුඩා සෝපාකව අමු සොහොනට රැගෙන ගිය ඔහුගේ සුළුපියා ඔහුව මළ මිනියකට තියල බැන්දා. මහා කරුණාවෙන් ලොව බැලූ බුදුහාමුදුරුවෝ අවුරුදු හතක් වයසැති සෝපාක අඬමින් දුක්වෙමින් අධික සීතලෙන් හා බියෙන් ඉන්න බව දුටුවා. උන්වහන්සේ සොහොනට වැඩමකර සෝපාකව බැම්වලින් නිදහස් කරගෙන විහාරයට එක්කරගෙන ගිහිල්ලා පැවිදි කළා. තම දරුවා සොයාගෙන පැමිණි අම්මාට ද බුදුහාමුදුරුවන් ධර්මය දේශනා කළා. ඒ ධර්මය ඇසූ සෝපාක පොඩි හාමුදුරුවෝ රහත් වුණා.



**2.5 රූපය**

ඒ කතාවෙන් ද අපට පැහැදිලි වන්නේ අපේ බුදුහාමුදුරුවෝ මහා කරුණාවෙන් යුතු ව අසරණයන්ට පිහිට වූ හැටි නේද? මේ දෙදෙනාට විතරක් නොවෙයි **අදින්න පුබ්බක** නමැති ලෝභ සිටුවරයාගේ පුතා වූ මට්ටකුණ්ඩලීට

මරණාසන්න මොහොතෙහි පිහිට වූ ආකාරය හා ස්වාමි දූවගේ වධ හිංසා ඉවසීමට නො හැකි ව මැරෙන්න ගිය රජ්ජුමාලාවට පිහිට වීම තුළින් ද බුදුරජාණන් වහන්සේගේ අසරණ සරණ ගුණය පැහැදිලි වෙනවා.

ඒ විතරක් නො වෙයි, උන්වහන්සේ බොහොම සැලසුම් සහගත ව අසරණයකුට පිහිට වූ අවස්ථාවක් තමයි කෙත පාලු වූ ගොවියාගේ කථාව. ඒ කියන්නේ බුදුහාමුදුරුවෝ දැනගෙන හිටියා ඒ ගොවියාගේ කෙත පාලුවන බවත් එවිට ඔහුට පිහිට වීමට කිසිවකු නැති බවත්. ඒ නිසා කුඹුර කොටන විටත් නියර බඳින විටත් වී වපුරන විටත් ආදී වශයෙන් බුදුහාමුදුරුවෝ එක් එක් අවස්ථාවල දී ඒ කුඹුරට වැඩම කර ගොවියා සමඟ කතාබස් කරමින් සිටියා. ඔහුගේ කුඹුර පැසෙන විට ගංවතුරෙන් විනාශ වුණා. ඒ අවස්ථාවේ දී බුදුහාමුදුරුවෝ ඔහුට ධර්ම දේශනා කරලා ඔහුගේ දුක නැති කළා.

අපේ බුදුහාමුදුරුවෝ ඔහුට විතරක් නො වෙයි පිහිට වුණේ. **පටාචාරා, කිසාගෝතමී,** දරුවන් විසින් පිටමං කළ **මහාසාල** නම් මහලු පියාණන් ආදි වශයෙන් විශාල පිරිසකට පිහිට වුණා.

අපේ බුදුහාමුදුරුවන්ගේ කරුණාව යොමු වුණේ මිනිසුන්ට විතරක් නො වෙයි. සතුන්ටත් යොමුවුණා. හොඳ ම උදාහරණය තමයි **උදේනි** රජතුමාගේ **භද්‍රවතිකා** ඇතින්නට පිහිට වීම.

විශාලා මහනුවර තුන්බිය දුරු කිරීමට රතන සූත්‍රය දේශනා කිරීම ද තවත් කදිම නිදසුනක්. එයින් පොදු ජනතාවට ද සෙත සැලසුණා.

මේ අනුව අපේ බුදුහාමුදුරුවෝ සියලු සතුන් ගැන කරුණාවෙන් යුක්ත ව පිහිට වූ අයුරු ඔබට දැන් පැහැදිලි වෙන්න ඇති. මගේ කථාව මෙයින් නිමා කිරීමට පෙර 'අපි සියලු දෙනාත් අසරණයින්ට හා ගිලනුන්ට උපස්ථාන කරමු' යන උදාර අධිෂ්ඨානය ඔබ තුළ ඇති කර ගන්නා ලෙස මම ඉල්ලා සිටිනවා. ඔබ සැමට තෙරුවන් සරණයි.

**සභාපති**

සඳුන් සොයුරාට ස්තුතියි. අද අපේ කථිකෝදය සමිතියේ විශේෂ වැඩ සටහන නිමාවට පත් කිරීමට මුලසුනේ දෙසුම සඳහා ගරු අනුශාසක ස්වාමීන් වහන්සේට ගෞරවයෙන් ආරාධනා කරනවා.

මුලසුනේ දෙසුමෙන් හා ලේකම්තුමාගේ ස්තුති කථාවෙන් එදින සමිතියේ වැඩ නිමාවට පත් විය.

**සාරාංශය**

රෝගී වූවන් ගිලනුන් වශයෙන් ද කිසිවකුගේ පිහිට නො ලද අය අසරණයන් වශයෙන් ද හැඳින්වෙති. බුද්ධ චරිතය තුළ මෙම අසරණ සරණ ගුණයත් ගිලානෝපස්ථානයත් මැනවින් විද්‍යමාන වේ. බුදුරජාණන් වහන්සේ ජාති, කුල, ආගම්, උස්මිටි භේද නොසලකා සියලු දෙනාට ම පිහිට වූහ. මිනිසුන්ට පමණක් නො ව තිරිසන්ගත සතුන්ට ද උන්වහන්සේ පිහිට වූ සේක. එම නිසා බෞද්ධ දරුවන් වන අපි ද ගිලානෝපස්ථානය කිරීමෙන් හා අසරණයන්ට සරණවීමෙන් නිරාමිස ප්‍රීතිය ලබා ගනිමු.

**ක්‍රියාකාරකම**

1. බුදුරජාණන් වහන්සේ ගිලනුන්ට උපස්ථාන කළ අවස්ථා දෙකක් නම් කරන්න.
2. බුදුරජාණන් වහන්සේගේ අසරණසරණ ගුණය පැහැදිලි කිරීමට නිදසුන් පහක් ලියන්න.
3. ගිලනුන්ට උපස්ථාන කරන ආකාරයත් අසරණයන්ට පිහිට විය යුතු ආකාරයත් විස්තර කරන්න.

**පැවරුම**

පන්තියේ සියලු දෙනා එකතු වී ගිලනුන්ට උවටැන් කළ අවස්ථා හා අසරණයන්ට පිහිට වූ අවස්ථා විස්තර කරමින් පොත් පිංචක් සකස් කරන්න.